2024 . 12 . 12 දිවයින. පිටු 2

# සංගණන නිලධාරීන්ට බිය නොවී තොරතුරු දෙන්න

## ජන හා සංඛ්‍යා ලේඛන අධ්‍යක්ෂ ජනරාල්

සුජීව තත්සර

පසුගිය ඔක්තෝබර් මස ආරම්භ කළ ජන හා නිවාස සංගණනයේ යෙදී සිටින නිලධාරීන්ට ඇතැම් නිවාසවලින් තොරතුරු ලබා නොදීමේ තත්ත්වයක් වාර්තා වී ඇතැයි ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, අනෝජා සෙනෙවිරත්න මහත්මිය පවසයි.

මෙම තත්ත්වය යටතේ සංගණන කටයුතු නිසි ලෙස සිදු කිරීමට බාධා මතුව ඇති බවත්, තොරතුරු ලබානොදීම් කොළඹ ප්‍රදේශයෙන් වැඩිපුර වාර්තා වී ඇති බවත් ඇය සඳහන් කළාය.

සංගණන කටයුතු සඳහා නිවාස වෙත පැමිණෙන ගණන් ගැනීමේ නිලධාරීන්ට අවශ්‍ය නිවැරදි තොරතුරු ලබාදීමට කිසිදු බියක් ඇති කරගත යුතු නැතැයි ද අධ්‍යක්ෂ ජනරාල්වරිය පැවසුවාය. මෙම සංගණනය සඳහා නිලධරීන් 35,000 ක් රට පුරා සේවයේ යෙදී සිටින බවත් ඉදිරි වසර දහය සඳහා ජාතික ප්‍රතිපත්ති සම්පාදනයට සැලසුම් සකස් කිරීමට අවශ්‍ය තොරතුරු මෙමගින් රජයට ලබාදීමට කටයුතු කරන බවත් ඇය කීවාය. ජන හා නිවාස සංගණනයේ කටයුතු මෙම මස 23 දා අවසන් වීමට නියමිතය.